2003 / 01

2003 අංක 35 දරණ ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ටපුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
4 (1) වගන්තිය යටතේ පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් ඉල්ලා සිටීම

අයදුම්කරුවන්ට උපදෙස්

(කරුණාකර අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර පහත උපදෙස් කියවා බලා ඒ අනුව කටයුතු කරන්න.)

(අ) <u>පොදු උපදෙස්</u>

1. අයදුම්පත්‍රයේ 3 (අ) යටතේ සම්පූර්ණ නම සඳහන් කරන්න.
2. අංක 3 (ආ) යටතේ තැපැල් ලිපිනය පැහැදිලිව සඳහන් කරන්න.
3. අංක 4 යටතේ සඳහන් පොදු ප්‍රකාශන පත්‍රය සෑම අයදුම්කරුවකු විසින් ම සම්පූර්ණ කළ යුතුය.
4. අංක (5) යටතේ සඳහන් විශේෂ ප්‍රකාශන පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ ඉන්දියානු ගමන් බලපත්‍රධාරීන් විසින් පමණකි.
5. පවුලේ සෑම පුද්ගලයෙකු සඳහා ම එක් අයදුම්පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතුයි. හැකි සෑම විටම පවුලේ සාමාජිකයන් සියලු දෙනාගේම අයදුම්පත් සියල්ලම එක් කට්ටලයක් වශයෙන් ඉදිරිපත් කිරීමෙන් කටයුතු පහසු වනු ඇත. (උදා:- මව, පියා, 2003.11.11 දිනට පෙර උපත ලද දරුවන් ආදී වශයෙන්)
6. මෙම පනත යටතේ පුරවැසිභාවයට හිමිකම් ලබන දෙමාපියන්ගේ 2003.11.11 දින හෝ ඊට පසු උපත ලබන දරුවන් පරම්පරාවෙන් පුරවැසියන් වන බැවින් මෙම පනත යටතේ පුරවැසි සහතික සඳහා ඉල්ලුම් නොකළ යුතුය.
7. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය.
   - උප්පැන්න සහතිකයේ පිටපතක්
   - ජාතික හැඳුනුම්පතේ පිටපතක් (තිබේනම්)
   - අයදුම්කරුගේ දෙමාපියන් පුරවැසි සහතික ලබා තිබේ නම් ඒවායේ පිටපත්
   - හෝ තම උපත හා අනෙකුත් සිවිල් විස්තර සනාථ කළ හැකි වෙනත් යම් ලියවිලිවල පිටපත් (දරුවන්ගේ උප්පැන්න සහතික, විවාහ සහතිකය, පාසැල් හැරයාමේ සහතිකය, ආදී වශයෙන්)
8. සම්පූර්ණ කළ අයදුම්පත් පහත ලිපිනයට පැමිණ භාර දීමට හෝ තැපැලෙන් එවිය හැකිය.

කොමසාරිස්,
ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
04 මහල, අංක 41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10
දුරකථන අංක 011 5329430 - 011 5329435

(ආ) <u>ඉන්දියානු ගමන් බලපත්‍රධාරී අයදුම්කරුවන්ට පමණක් විශේෂ උපදෙස්</u>

1. අයදුම්කරු විසින් මීට පෙර 2 වන වගන්තිය යටතේ වූ විශේෂ ප්‍රකාශනය මා වෙත එවනු ලැබ, මවිසින් ඒ බව දැනුම් දීමේ ලිපි නිකුත් කොට ඇත්නම් එම දැනුම්දීමේ ලිපියේ (යොමු අංකය පැහැදිලිව පෙනෙන සේ ලබා ගත් ) ඡායා පිටපතක් අයදුම්පතට ඇමිණිය යුතුය.
2. අයදුම්කරු විසින් අවසාන වරට ලබා ගත් ඉන්දියානු ගමන් බලපත්‍රයේ පැහැදිලි ඡායා පිටපතක් අයදුම්පතට ඇමිණිය යුතුය.
3. අයදුම්කරු වෙත මුලින්ම නිකුත් කළ ඉන්දියානු ගමන් බලපත්‍රයේ පැහැදිලි ඡායා පිටපතක් (ඇත්නම් පමණක් ) අයදුම්පතට අමුණන්න.

# 2003 ஆம் ஆண்டின் 35 ஆம் இலக்க இந்திய வம்சாவழியினரான ஆட்களுக்கு பிரஜாவுரிமை வழங்கல் சட்டத்தின் 4(I) ம் பிரிவின் கீழ் பிரஜாவுரிமை சான்றிதழிற்கு விண்ணப்பிப்பதற்கான அறிவுறுத்தல்கள்

விண்ணப்பத்தினை சமர்ப்பிப்பதற்கு முன்பு தயவுசெய்து முழு அறிவுறுத்தல்களையும் பின்பற்றவும்.

(அ) பொது அறிவுறுத்தல்

(1) விண்ணப்பதாரரின் முழுப்பெயரினை விண்ணப்பபடிவத்தின் இலக்கம் 3(அ) இல் சரியாகவும் தெளிவாகவும் எழுதவும்.

(2) விண்ணப்பப்படிவத்தின் இலக்கம் 3(ஆ) இல் அஞ்சல் முகவரியை சரியாக எழுதவும்.

(3) ஒவ்வொரு விண்ணப்பதாரரினாலும் பந்தி (4) இல் உள்ள பொது வெளிப்படுத்துகையானது பூரணப்படுத்தப்படல் வேண்டும்

(4) இந்திய கடவுச்சீட்டினை வைத்திருக்கும் விண்ணப்பதாரரினால் மட்டும் பந்தி (5) இல் உள்ள விசேட வெளிப்படத்துகையானது பூரணப்படுத்தப்படல் வேண்டும்

(5) அத்தாட்சிப்பத்திரத்தினை துரிதமாகவும் எளிதாகவும் வழங்குவதற்காக குடும்பத்தில் உள்ள ஒவ்வொருவரும் தனித்தனியாக விண்ணப்பபத்திரத்தினை பூரணப்படுத்துவதுடன் ஒரே குடும்பமாயின் விண்ணப்பபடிவத்தினை ஒரு தொகுதியாக (தாய்,தந்தை, மற்றும் 11.11.2003ற்கு முன்னர் பிறந்த பிள்ளைகள்) சமர்ப்பிக்கவும்.

(6) பெற்றோர்கள் இந்த சட்டத்தின் கீழ் பிரஜாவுரிமை உடையவர்களாயின் 11.11.2003 ஆம் திகதியோ அல்லது அதற்கு பின்னரோ பிறந்தவர்கள் பிரஜாவுரிமை சான்றிதழிற்காக இந்த சட்டத்தின் கீழ் விண்ணப்பிக்க தேவையில்லை ஏன் எனில் அவர்கள் பிறப்பினால் குடியுரிமை உடையவர்கள் ஆவர்.

(7) கீழே குறிப்பிடப்படும் ஆவணங்களின் பிரதிகள் விண்ணப்பப்பத்திரத்துடன் சமர்ப்பித்தல் வேண்டும்.

- ★ பிறப்பு அத்தாட்சிப்பத்திரத்தின் பிரதி.
- ★ தேசிய அடையாள அட்டையின் பிரதி. (இருப்பின்)
- ★ பெற்றோர்களின் பிரஜாவுரிமை பத்திரங்களின் பிரதிகள். (இருப்பின்).
- ★ அல்லது உங்களுடைய பிறப்பினையும் குடியியல் நிலையையும் உறுதிப்படுத்துவதற்கான வேறு ஏதாவது ஆவணங்கள்.(பிள்ளையினுடைய பிறப்பு அத்தாட்சிப்பத்திரம்,திருமண அத்தாட்சிப்பத்திரம்,பாடசாலை விடுகைப்பத்திரம், வேறு)

(8) சரியாக பூரணப்படுத்தப்பட்ட விண்ணப்பபடிவங்களை நேரடியாக கையளிக்க முடியும் அல்லது கீழே குறிப்பிடப்பட்ட முகவரிக்கு தபாலில் அனுப்பமுடியும்.

ஆணையாளர்,
இந்திய வம்சாவழியினரான ஆட்களை பதிவதற்கான திணைக்களம்,
4வது மாடி,
இல.41, ஆனந்த ராஜகருணா மாவத்தை,
கொழும்பு – 10.
தொலைபேசி 011-5329430 , 011-5329435

(II) இந்திய கடவுச்சீட்டினை வைத்திருக்கும் விண்ணப்பதாரருக்கான விசேட அறிவுறுத்தல்.

(1) சட்டப்பிரிவு 2 இன் கீழ் தங்களுடைய வெளிப்படுத்துகைகளை திணைக்களத்திற்கு அனுப்பி அதற்குரிய பதிலை திணைக்களத்திலிருந்து ஏற்கனவே பெற்றுக்கொண்டால் அதனுடைய குறிப்பு எண் தெளிவாக தெரியக்கூடியவாறான பிரதி ஒன்றினை விண்ணப்பப்படிவத்துடன் இணைக்கவும்.

(2) விண்ணப்பதாரர் தற்போது வைத்திருக்கும் இந்திய கடவுச்சீட்டின் தெளிவான பிரதி ஒன்றினை விண்ணப்பப்படிவத்துடன் இணைக்கவும்.

(3) விண்ணப்பதாரரின் முதலாவது இந்திய கடவுச்சீட்டின் தெளிவான பிரதி ஒன்றினை விண்ணப்பப்படிவத்துடன் இணைக்கவும்.(இருப்பின்)